# "පුද්ගල කායික සංවර්ධනය" බෞද්ධ හා මනෝවිද්‍යාත්මක ආකල්ප පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

sobitha karapikkada[1]

ජීවියෙකු මව්කුස පිළිසිඳ ගත් අවස්ථාවේ සිට මරණය දක්වා විවිධාකාර වූ විභජනයන්ට භාජනය වේ. මෙම පුද්ගල පරිණාමය මනෝ විද්‍යාව තුළ "ප්‍රජානන සංවර්ධනය" ලෙස දැක් වේ. මේ තුළ පුද්ගලයාගේ කායික වර්ධනය මෙන් ම මානසික වර්ධනය ද සිදුවන අතර, එහි දී ඔහුගේ පෞරුෂය හා සමාජ වර්ධනය සිදු වේ. මනෝ විද්‍යාඥයන්ගේ මතයන්ට අනුව 'ආරය' මෙහි දී ප්‍රමුඛ සාධකයක් ලෙස දැක්වෙන අතර, පාරිසරික සාධකයන්ගේ බලපෑම ද සෘජු වශයෙන් සිදු වේ. පශ්චාත් කාලීනව පාරිසරික සාධකයන්ගේ බලපෑම මත ආරමය ලක්‍ෂණ පුද්ගලයා තුළින් බැහැරවිය හැකි බව මනෝවිද්‍යාවේ මතයයි. ආරය හා පාරිසරික සාධක මත සිදුවන්නා වූ පරිණතය තුළ ක්‍රමයෙන් පුද්ගල කායික සංවර්ධනය ද සිදු වේ. මනෝවිද්‍යාව තුළ අවධි සංකල්පය යටතේ විග්‍රහ වනුයේ මෙම පුද්ගල කායික සංවර්ධනයයි. එහි මූලික අවස්ථ හතරක් ප්‍රධානව දැකිය හැකි ය. 01)ළදරු අවධිය 02)ළමා අවධිය 03) නව යොවුන් අවධිය 04) වැඩිහිටි අවධිය යනුවෙනි. මෙයට අමතරව මුඛී අවධිය, අධෝමුඛී අවධිය, ලිංගේන්ද්‍රිය අවධිය යනුවෙන් පුද්ගල කායික වර්ධනය පිළිබඳ අවස්ථා තුනක් සිග්මන් ෆ්‍රොයිඩ් ඉදිරිපත් කොට ඇත. මනෝවිද්‍යාවේ පුද්ගල කායික සංවර්ධනය පිළිබඳ ප්‍රකට ඉදිරිපත් කිරීම සිදුකොට ඇත්තේ එරික් එරික්සන් විසිනි. ඔහුට අනුව පුද්ගල කායික වර්ධනයේ ප්‍රමුඛ අවස්ථා අටකි, බිළිදු විය, ඇවිදින විය, මුල්ළමා විය, මැදළමා විය, නවයොවුන් විය, යොවුන් විය, මධ්‍යම වැඩිවිය, පසු වැඩිවිය යනුවෙනි. මේ පිළිබඳ බෞද්ධ ආකල්පය විමසීමේ දී බුදුසමය තුළ ද පුද්ගල කායික හා මානසික වර්ධනය පිළිබඳ කරුණු දක්වා ඇත. කලලයේ නිර්මාණයේ සිට දරුවාගේ බිහිවීම දක්වා වර්ධනය පිළිබඳ සං.නි. ඉන්ද්‍රික සූත්‍රයේ දැක්වෙන අතර, ඉන් අනතුරුව පුද්ගලයාගේ වර්ධනයේ දී මනෝවිද්‍යාවේ දැක්වූ ආරය හා පාරිසරික සාධකයන්ට අමතරව සාංසාරික කර්ම ශක්තීන්ගේ බලපෑම ද බුදුසමය අවධාරණය කරයි. එහි දී "මන්ද" හෙවත් දිළිඳුවිය, " කිඩ්ඩාවිය" හෙවත් කුමාර අවධිය, වර්ණ අවධිය, බල අවධිය, ප්‍රඥා අවධිය, හායන අවධිය, පබ්භාර අවධිය, වංක අවධිය, මෝහමූල අවධිය, සයන අවධිය යනුවෙන් බුදුසමයේ පුද්ගලයාගේ කායික වර්ධනයේ ප්‍රමුඛ අවස්ථා දහයක් දක්වා ඇති අතර මෙයින් බොහොමයක් මනෝවිද්‍යාවේ වර්ගීකරණයන් හා සමාන බවක් දක්නට ඇත. අපගේ මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් පුද්ගල කායික වර්ධනය පිළිබඳ බෞද්ධ හා මනෝවිද්‍යාත්මක ආකල්ප තුලනාත්මකව අධ්‍යයනය කොට, එහි දක්නට ඇති සුවිශේෂත්වයන් හඳුනාගැනීමට අපේක්‍ෂිත ය.

**ප්‍රමුඛ පදඃ**කායික සංවර්ධනය, මානසික සංවර්ධනය, ආරය, මනෝවිද්‍යාව, බුදුදහම

---

[1] The Bhikshu University of Sri Lanka



CamScanner